# මගේ අරුම පුදුම දත් දෙක



කවිනි නිහින්සා මෙනන්

# මගේ අරුම පුදුම දත් දෙක

කවිනි නිහින්සා මෙනන්

2023 නොවැම්බර් 15

ISBN 978-624-206-599-1

# පිදුම

මට හැමදාම ආදරය කරන

අම්මා, තාත්තා, අක්කා ඇතුළු පවුලේ

සැමටත්, මගේ සියලුම යහළුවන්ටත්,

මට ලස්සනට සිංහල අකුරු ලියන්න,

කියවන්න කියාදුන්

වාසනා ගුරු මෑණියන්ටත්,

මට ඉගැන්වූ සියලුම ගුරු මෑණිවරුන්ට සහ

පියවරුන්ටත් මෙම නිර්මාණය

බැති සිතින් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන, ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක් “ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක් “ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

**ශෂිකලා සේනාධීර**
විදුහල්පතිනිය,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 .11.01

# මගේ අරුම පුදුම දත් දෙක

මම එක දවසක් අක්කත් එක්ක සෙල්ලම් කර කර ඉද්දි, මමයි අක්කයි විහිළු කර ගත්තා. මම අක්කාට දිව ඇද කරලා පෙන්නුවා. එහෙම එහෙට මෙහෙට දිව ඇද කරනකොට, මට කට ඇතුලේ මොකක්දෝ කාඩ්බෝඩ් වගේ දෙයක් හයියට දැනුණා.

මම අක්කාගෙන් ඇහුවා " අක්කේ, බලන්නකො මගේ කට ඇතුලෙ මොනවද තියෙන්නේ කියලා." අක්කා කිව්වා " යට ඇන්දේ අලුත් දත් දෙකක් එනවා, නංගී. ඒ වගේම ඉස්සරහ තියෙන දත් දෙකත් හෙලවෙනවා" කියලා.

මම හොඳටම බය වුණා. මම කෝල් කරලා හැමෝටම කිව්වා දත් දෙකක් හෙලවෙනවා කියලා. දත් දෙක හෙලවෙන කොට, මට අලුත් දත් දෙකකුත් ඇවිල්ලා ඉවරයි. මම දත් දෙක ගලවන්ඩ හැදුවා. ඒ උනාට ගැලවුණේ නැහැ.

ඊට පස්සේ මේ හෙලවෙන දත් දෙක ගලවන්න, තාත්තා නූලක් අරගෙන දත් දෙක ගැට ගහල ඇද්දා. ඒත් මේ පුදුම දත් දෙක ගැලවුණේ නැහැ.

මොකක්ද උනේ කියලා දන්නවා ද? නූල් කෑල්ල දෙකට කැඩුණා. එක නූල් කෑල්ලක් තාත්තාගෙ අතේ. අනිත් නූල් කෑල්ල මගේ දතේ.

එල්ලෙන නූලට බර දෙයක් එල්ලලා බැලුවා. ඒත් දත් දෙක ගැලවුණේ නැහැ. ඊට පස්සේ තාත්තා හිතුවා දත් දොස්තර කෙනෙකුට මාව පෙන්න ගන්න.

එතකොට තාත්තා කිව්වා දත් දොස්තර නැන්දා නිවාඩු දාලා කියලා. ඒ නිසා වෙන දවසක එන්න කියලා.

ඊට පස්සේ නර්ස් නැන්දා, තාත්තාට වෙන දවසක් වෙන් කරලා දුන්නා.

ඒ දවසේ, මම හෙමීට බයෙන් බයෙන් කාර් එකට නැගලා, බයෙන් බයෙන් දොස්තර නැන්දා ගාවට ගියා.

දොස්තර නැන්දා මට කිව්වා "බයවෙන්න එපා පුතේ" කියලා. මම බය නැතිව ඩෙන්ටිස්ට් පුටුවේ වාඩි වුණා. දොස්තර නැන්දා පුටුව චුට්ටක් ළංකර ගත්තා. ඊට පස්සේ දොස්තර නැන්දා "මේ දත නම් ගලවන්න පුළුවන්" කියලා ඉන්ජෙක්ෂන් ගහන්නේ නැතිව ම එක දතක් කෙලින් ම ඇදලා ගත්තා.

ඒක නං රිදුනේ නෑ. හැබැයි අනික් දත කොච්චර ඇද්දත් ගැලවුණේ නැහැ. ඒ නිසා ඉන්ජෙක්ෂන් එකක් ගැහුවා. මට නම් මොනවත්ම දැනුණේ නෑ. දොස්තර නැන්දා කිව්වා මට කෙළ ගහන්න කියලා.

පුළුන් කෑල්ලක් කටේ ඔබා ගන්න කියලත් කිව්වා. මම පුළුන් කෑල්ල කටේ ඔබාගෙන ඉන්නකොට, මට හොඳටම හිනා ගියා.

''හි... හි... හි....හි.....'' එතකොට පුළුන් කෑල්ල එලියට ගත්තා. ඒක දැකලා මට ආයෙත් හොඳටම හිනා ගියා.

මම හිනාවෙච්ච හිටියයි කියලා, දොස්තර නැන්දා මට ස්ටිකර් එකකුයි, පැන්සලකුයි තවත් සෙල්ලම් බඩුයි තෑගි දුන්නා.

දොස්තර නැන්දා කිව්වා ලොකු පේර ගෙඩියක් කලින්ම හපලා තිබුණා නම් ඔය දත් දෙක නිකම්ම වැටිලා ඇති කියලා.

ඊට පස්සේ මම බිම බලාගෙන ලැජ්ජාවෙන් ගෙදර ආවා. මගේ අරුම පුදුම දත් දෙක ගැලෙව්වෙ ඔන්න ඔහොමයි.

නිමි.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු .

මෙයට
**සෙනෙවිරත්න මහලේකම්**
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ
ව්‍යාපෘතියේ නිර්මාපක
2023 11.01